

# වුළූඃ දෝවණය කළ යුත්තේ කෙසේ ද?

වුළූඃ දෝවණය නම් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙත ඉටු කරනාකාරය ගැන විස්තරාත්මක හා රූපිත විග්‍රහයක්

# වුළූඃ දෝවණය කළ යුත්තේ කෙසේ ද?

වුළූඃ දෝවණය නම් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙත ඉටු කරනාකාරය ගැන විස්තරාත්මක හා රූපිත විග්‍රහයක්

مركز أصول
OsoulCenter

ح جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٦ هـ

**مركز أصول**

كيف أتوضأ: شرح مصور لكيفية الوضوء مع وقفات مع هذه الشعيرة العظيمة باللغة السنهالية. / مركز اصول - ط ١. .- الرياض ، ١٤٤٦ هـ

٤٨ ص ؛ ١٤.٨ x ٢١ سم

**رقم الإيداع: ١٤٤٦/١٩١٥٧**

**ردمك: ٩٧٨-٦٠٣-٨٤٣٨-٩٨-٥**

Osoul Center
www.osoulcenter.com


- **මෙම අනුවාදය උක්ත මධ්‍යස්ථානය විසින් සකස් කර නිර්මාණය කරන ලදී.**
- **මෙම මධ්‍යස්ථානය පිළිබඳ සඳහන් කර පාඨය වෙනස් නොකර ඕනෑම ආකාරයකින් මෙම සංස්කරණය මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට උක්ත මධ්‍යස්ථානයේ අනුමැතිය හිමි වේ.**
- **මුද්‍රණය කිරීමේදී, උසූල් මධ්‍යස්ථානය විසින් අනුමත කරන ලද තත්ත්ව ප්‍රමිතීන් පිළිපැදිය යුතුය.**

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

අපරිමිත දයාවන්ත අසමසම කරුණාවන්ත අල්ලාහ්ගේ නාමයෙන්



# පෙරවදන

සර්ව පැසසුම් විශ්ව පරමාධිපති අල්ලාහ්ට ම ය, අප දේව දූත මුහම්මද්තුමාණන් කෙරෙහි ද එතුමාණන්ගේ පවුල හා මිත්‍රාදි සැම කෙරෙහි ද මහිමාන්විත අල්ලාහ් ආසිරි හා ශාන්තිය උදා කරන සේක්වා! එපරිදි,

ඉස්ලාමය වනාහි පවිත්‍රත්වයේ දහමකි. ශාරීරික පවිත්‍රත්වය, වස්ත්‍ර පවිත්‍රත්වය, ස්ථාන පවිත්‍රත්වය නම් භෞතික පවිත්‍රත්වාංග මෙන් ම පාපය, දුර්ගුණ, පාපී සිතුවිලි නම් ආධ්‍යාත්මික පවිත්‍රත්වාංග මත ද ගොඩනැගුණු දහම යි.

උත්තරීතර අල්ලාහ් නොයෙක් අවස්ථාවල මුස්ලිම්වරයෙකු කෙරෙහි මෙම පිරිසිදුභාවය පනවා ඇත. ඉස්ලාමයේ මූලික කුලුනක් ද පරමාධිපති හා ගැත්තා අතර පවත්නා අතිශ්‍රේෂ්ඨ සබඳතාවයක් ද වන සලාතය උදෙසා ද මෙම පිරිසිදුබව අනිවාර්ය වේ. සලාතයෙහි මාහැඟිභාවය නිරූපණය කිරීම පිණිස අසාන් කීම (සලාතය සඳහා වන කැඳවුම), අලංකාර පිරිසිදු වස්ත්‍ර පැලඳ සිටීම වැනි උසස් පූර්වාංග සලාතය ඉටු කිරීමට මත්තෙන් උත්තරීතර අල්ලාහ් නියම කොට ඇත. පිරිසිදු වීම පිණිස කරනා වුළූඃ දෝවණය, ස්නානය, වුළූඃ පිළිවෙතට හෝ අනිවාර්ය ස්නානයට විකල්පයක් වශයෙන් කරන තයම්මුම් ද එවන් උසස් පූර්වාංග වේ.



මහිමාන්විත අල්ලාහ් පවසන සේක: (විශ්වාසවන්තයිනි, ඔබලා සලාතය ඉටු කිරීමට නැගී සිටින විට ඔබලාගේ මුහුණු ද ඔබලාගේ අත් වැලමිට තෙක් ද සෝදනු. තව ද, ඔබලාගේ හිස (ජලයෙන්) පිස දමනු. තව ද, වළලුකර දක්වා ඔබලාගේ පාද ද (සෝදනු.) තව ද, ඔබලා ජුනුබ් (මහා කිල්ලට අයත් අපිරිසිදුබවට) පත් වූවෙහු නම්, (දිය නා) පිරිසිදු වනු. ඔබලා රෝගී ව සිටියෙහු නම් හෝ ගමනක යෙදී සිටියෙහු නම් හෝ ඔබලාගෙන් කිසිවෙක් මල මුත්‍ර පහ කළේ නම් හෝ ඔබලා ස්ත්‍රීන් ස්පර්ශ කළෙහු නම් හෝ ජලය ලබාගත නොහැකි විටක පිරිසිදු පස් සොයා (ඔබලාගේ අත්ල පස් මත තබා) එයින් ඔබලාගේ මුහුණු සහ ඔබලාගේ අත් පිස දමනු.) පරිච්ඡේදය අල් මාඉදා : වැකිය 06

දේව දූත මුහම්මද්තුමාණෝ මෙලෙස පැවසූහ: ((කිල්ලට හසු වී අපිරිසිදුභාවයට පත් කිසිවෙකුගේ සලාතය උත්තරීතර අල්ලාහ් පිළිගන්නේ නැත.)) මූලාශ්‍රය : බුහාරි සහ මුස්ලිම්.

වුළූඃ දෝවණය මහිම ගණනාවකින් යුක්ත ය. එනම්; එය ඊමානය නම් විශ්වාසයෙන් කොටසකි, උත්තරීතර අල්ලාහ් එමගින් පව් සමා ප්‍රදානය කරන්නේය, තරාතිරම් උසස් කරන්නේය, එය ස්වර්ගයට යන මගකි, පරමාන්ත දිනයේ දී මුස්ලිම්වරයෙකුගේ ආලෝකයකි, සාතන්ගේ කුමන්ත්‍රණකාරී ගැට ලිහා දමන්නකි, පරමාන්ත දිනයේ දී දේව දූත මුහම්මද්තුමාගේ අනුගාමික මෙම සමාජයේ විශේෂිත සලකුණකි, එම අනුගාමිකයෝ මෙකී වුළූඃ දෝවණ සලකුණු හේතුවෙන් මුහුණු අත් පා දිලිසෙන ප්‍රභාවන්තයින් සේ පරමාන්ත දින පැමිණෙති.

දේව දූත මුහම්මදතුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරාතුමා මෙපරිදි වාර්තා කරයි: ((මුස්ලිම් ගැත්තෙකු -හෝ විශ්වාසවන්තයෙකු- වුළූඃ දෝවණය කරන විට සිය මුහුණ සෝදනා කල, සියැස්වලින් කළ සෑම පාපයක් ම වැගිරෙනා එම දිය සමඟ ම හෝ අවසාන දිය බිඳුවත් සමඟ මුහුණෙන් සේදී යන්නේය; ඔහු සිය දෑත් සෝදනා කල, සිය දෝතෙහි ග්‍රහණයෙන් වූ සෑම පාපයක් ම වැගිරෙනා එම දිය සමඟ ම හෝ අවසාන දිය බිඳුවත් සමඟ දෑතින් සේදී යන්නේය; ඔහු සිය දෙපා සෝදනා කල දෙපයින් ඇවිද ගොස් කළ සෑම පාපයක් ම වැගිරෙනා එම දිය සමඟ ම හෝ අවසාන දිය බිඳුවත් සමඟ දෙපයින් සේදී යන්නේය; මෙලෙස ඔහු පාපයන්වලින් බැහැර වූ පවිත්‍ර කෙනෙක් වන්නේය.)) මූලාශ්‍රය: මුස්ලිම්.

දේව දූත මුහම්මදතුමාණන් ප්‍රකාශ කරනු තමා ඇසූ බව අබූ හුරෙයිරාතුමා මෙසේ වාර්තා කරයි: ((මාගේ අනුගාමික සමාජය වුළූඃ දෝවණ සලකුණු හේතුවෙන් මුහුණු අත් පා දිලිසෙන ප්‍රභාවන්තයින් සේ පරමාන්ත දින පැමිණෙති))





# පටුන

| | මාතෘකාව | පිටු අංකය |
|---|---|---|
| 1 | ඉස්ලාමයෙහි පිරිසිදුභාවය | 11 |
| 2 | සලාතය සඳහා අත්‍යවශ්‍ය පිරිසිදුභාවය | 13 |
| 3 | කාන්තාවට විශේෂිත වූ නීති රීති | 17 |
| 4 | මල මුත්‍ර පහ කිරීමේ ආචාර විධි | 19 |
| 5 | වුළූඃ කරන්නේ කෙසේ ද? | 23 |
| 6 | මහා කිල්ලෙන් පවිත්‍ර වීම උදෙසා ස්නානය කරන්නේ කෙසේ ද? | 34 |
| 7 | පිරිසිදු වීමේ ඇතැම් විශේෂිත ක්‍රම හා අවස්ථා | 35 |
| 8 | ඇගයීම | 40 |



# ඉස්ලාමයෙහි පිරිසිදුභාවය

ඉස්ලාමය තුළ පිරිසිදුභාවයට ඇත්තේ මහත් වටිනාකමකි. ජලය භාවිතයෙන් සිදු කෙරෙන භෞතික පිරිසිදු කිරීමට පමණක් මෙය සීමා නොවේ. ඇරත්, අපවිත්‍ර හා කිලුටු ඕනෑ ම දෙයකින් පවිත්‍ර වීම හා පාරිශුද්ධ වීම මින් අදහස් කෙරේ. එය භෞතික, ආධ්‍යාත්මික යන දෙවිෂයට ම අදාළ ය.

ආධ්‍යාත්මික පිරිසිදුභාවය යනු, උත්තරීතර අල්ලාහ් කෙරෙහි ආදේශ තැබීම හෙවත් ෂිර්ක් ක්‍රියාවෙන් ද, අසත්‍ය මිත්‍යා ඇදහිලි හා මිත්‍යා විශ්වාසවලින් ද, පහත් හා නීච ගුණාංගවලින් ද, ඊර්ෂ්‍යාව, වෛරය, මුස්ලිම්වරුන් කෙරෙහි තබනා වැරදි ආකල්ප, ක්‍රෝධය, මසුරුබව, වංචා සහගතබව වැනි දෑ වලින් ද තොර ව ඉන් මිදී සිය සිත පවිත්‍ර කරගැනීම යි.

භෞතික පිරිසිදුබව යනු, භෞතික අපවිත්‍රතාවලින් ද, සලාතය වැනි නැමදුම් වතාවත්වල වලංගුභාවය අහෝසි කරන, ඉස්ලාමය තුළ හදස් (කිල්ල) යනුවෙන් හැඳින්වෙන අපිරිසිදු තත්ත්වයන්වලින් ද මිදී පිරිසිදු වීම යි. වුළූඃ දෝවණය මඟින් හෝ මහා කිලි අවස්ථාවක ස්නානය මඟින් හෝ තයම්මුම් මඟින් එම අපිරිසිදුභාවය ඉවත් කෙරෙනු ඇත.



# සලාතය සඳහා අත්‍යවශ්‍ය පිරිසිදුභාවය

සලාතය වනාහි ගැත්තා සහ ඔහුගේ ස්වාමියා අතර වන රහසිගත කතාබහකි. එබැවින්, මුස්ලිම්වරයෙකු සිය පරමාධිපතියාණන් අබියස සිටගන්නා කල, ප්‍රශංසනීය අලංකෘත විලාසයකින් ද සුපිරිසිදු, සුපිවිතුරු තත්ත්වයකින් හා භක්තිමත්භාවයකින් ද සිටීම අතිවැදගත් ය. සලාතය කිරීම සඳහා සූදානම් වූ විට සිය ආත්මය, වස්ත්‍රය, නැමදුම් ස්ථානය යනාදිය සර්වාකාර අපවිත්‍ර හා කිලිවලින් පිරිසිදු කරගත යුතු බව උත්තරීතර අල්ලාහ් මුස්ලිම්වරයාට අනිවාර්ය කර ඇත්තේ ද එනිසාවෙනි.



සලාතය ස්ථාපිත කරන්නා පිරිසිදු කරගත යුතු දෑ:

**සලාතය ස්ථාපිත කරන්නා සිය සලාතයට ප්‍රථමයෙන් මහා කිල්ල සහ සුළු කිල්ලෙන් ද අපවිත්‍රතාවලින් ද පිරිසිදු වීම අනිවාර්ය වේ. එබව පහතින් විග්‍රහ කෙරේ:**

**හදස් හෙවත් කිල්ල :** මෙය සලාතයේ වලංගුභාවය අහෝසි කරවන අභෞතික තත්ත්වයකි. එපරිදි, මෙය කොටස් දෙකකට බෙදේ:

1. **සුළු කිල්ල:** මුත්‍රා හෝ මල හෝ ගුද මාර්ගයෙන් වාතය පිටවීම හේතුවෙන් හෝ මෙම තත්ත්වය ඇති වේ. එලෙස ම නින්ද ද තවත් හේතුවකි. උක්ත කාරණා හේතු කොටගෙන ඇති වන සුළු කිලි තත්ත්වයෙන් මිදීමට වුළූඃ දෝවණය කරගත යුතු යි.

2. **මහා කිල්ල:** මෙය ජනාබත් ලෙස ද නම් කෙරේ. සංසර්ගයේ යෙදීම හේතුවෙන් ද ශුක්‍ර මෝචනය හේතුවෙන් ද මෙම තත්ත්වය උදා වේ. මින් පිරිසිදු වීමට හිස ඇතුළු සර්වාංගය ම ජලයෙන් සේදීම හෙවත් ස්නානය සිදු කළ යුතු යි.


නජස් හෙවත් අපවිත්‍රතාවය: මෙය භෞතික අපවිත්‍රතාවයකි. මුත්‍රා, මල, ගලනා රුධිරය වැනි භෞතික දෑ මෙයට අන්තර්ගත යි. ජලය යොදා එම අපවිත්‍ර දෑ ඉවත් වන තුරු සෝදා හැරීමෙන් ඉන් මිදිය හැකි ය.

මුත්‍රා පිටවීම හදස් හෙවත් කිල්ල ලෙසින් හැඳින්වෙන අතර එම මුත්‍රා නජස් හෙවත් අපවිත්‍ර දෙයක් ලෙස හැඳින් වේ.

සලාතය ස්ථාපිත කරන්නා පෙර කී සර්වාකාර කිලි සහ අපවිත්‍රතාවලින් මිදී පිරිසිදු වීම අනිවාර්ය ය. එපරිදි;

- **සුළු කිල්ලට භාජනය වූ තත්ත්වයක නම්, වුළුඃ දෝවණය කළ යුතු යි.**
- **මහා කිල්ලට භාජනය වූ තත්ත්වයක නම්, ස්නානය කළ යුතු යි.**

එසේ ම, දේවල් තුනක් භෞතික අපවිත්‍රතාවලින් පිරිසිදු කරගත යුතු යි:





# කාන්තාවට විශේෂිත වූ නීති රීති

පවිත්‍රතා කර්තව්‍යයෙහි කාන්තාව ද පුරුෂයා සේ ය. එනමුත්, උත්තරීතර අල්ලාහ් කාන්තාව මාස් ශුද්ධිය, ගැබ් ගැනීම, දරු ප්‍රසූතිය යනාදි ඇතැම් කරුණු හරහා සුවිශේෂ කර ඇත. එවන් විශේෂත්වයකට හේතුව මහිමාන්විත අල්ලාහ්ගේ ප්‍රඥාවට පමණක් ගෝචර කරුණකි. මානව පැවැත්මේ අඛණ්ඩතාවය මඟින් මිහිතල පරිපාලනය සශ්‍රීක කරවීමේ උත්තුංග ක්‍රියාදාමය උදෙසා සුදුස්සා ලෙස කාන්තාව තේරී ඇත. ඉස්ලාමයේ දහම් සංග්‍රහය කාන්තාවගේ ශාරීරික හා මානසික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් මාස් ශුද්ධිය (හයිල්), පසු ප්‍රසව රුධිර වහනය වීමේ කාලය (නිෆාස්) වැනි අවස්ථාවල ඇයට පහසුවක් පිණිස අනිවාර්ය සලාතය පවා ඉටු නොකර සිටීමේ අවකාශය පිරිනමා ඇත. එපරිදි, එකී අවස්ථා දෙකෙහි ම ඇයට පූර්ණ පවිත්‍රත්වයට එළඹීම හෝ සලාතය ස්ථාපිත කිරීම අනිවාර්ය නැත. මාස් ශුද්ධිය හෝ පසු ප්‍රසව රුධිර වහනය වීමේ කාලය අවසන් වූ විගස ස්නානය කොට පිරිසිදු වීම ඇය කෙරෙහි අනිවාර්ය වේ.

සිය කෙස් ගොතා සිටින කතක් ජනාබත් (මහා කිල්ල) හෝ මාස් ශුද්ධිය හෝ පසු ප්‍රසව රුධිර වහනය වීම වැනි තත්ත්වයකින් මිදී පිරිසිදු වීම උදෙසා ස්නානය කරනා විට, සියලු හිසකෙස් තෙමෙනා පරිදි ස්නානය කරන්නී නම්, ඇය ගෙතූ එම කෙස් ලිහා දැමීමට අනිවාර්ය නැත.





# මල මුත්‍ර පහ කිරීමේ ආචාර විධි

ඉස්ලාමය මුස්ලිම්වරයෙකුගේ සමස්ත ජීවිතය ම නිසි පරිදි සකසා ඇත. සත්ත්ව ජීවිතයකින් වෙනස් ව මිනිසාට ගෞරවාන්විත දිවියක් උරුම කරගැනීම පිණිස එසේ හැඩගස්වා තිබේ. ඉස්ලාමය නොදන්නා කෙනෙකු වැදගත් යැයි නොසිතන සෑම අංගයක් ගැන ම අවධාරණය කර ඇත. සියලු මිනිසුන්ට අත්‍යවශ්‍ය, නොවැළැක්විය හැකි දෙයක් වන  මළ මුත්‍ර පහ කිරීමේ ස්වාභාවික අවශ්‍යතාවය ඉෂ්ට කරගන්නා ආචාර විධි ගැන ද සවිස්තර කොට තිබීම ඉස්ලාමීය සමස්ත ජීවන මඟපෙන්වීමට කදිම නිදසුනකි.

## මල මුත්‍ර පහ කිරීමේ ආචාර විධි:

- වැසිකිළියට ඇතුළු වන විට, වම් පාදය තබා යා යුතු යි. එවිට, දේව දූත සම්ප්‍රදා ඉගැන්වීමක් වන පහත ප්‍රාර්ථනාව කිව යුතු යි.

«اللهم إني أعوذ بك من الخبُث والخبائث».

((අල්ලාහුම්ම ඉන්නී අඌසු බික මිනල් (හු)කුබුසි වල් (හ)කබාඉසි))

(අදහස: දෙවිඳාණනි, පුරුෂ හා ස්ත්‍රී සාතනුන්ගේ උවදුරුවලින් ඔබගෙන් ආරක්ෂාව පතමි.)

- වැසිකිළියෙන් පිට වන විට, දකුණු පාදය තබා පිට විය යුතු යි. එවිට, පහත ප්‍රාර්ථනාව කිව යුතු යි.

«غُفْرانك»

((ගුෆ්රානක))

(අදහස: දෙවිඳාණනි, ඔබගෙන් සමාව අයදිමි)

- වැසිකිළිය තුළ මල මුත්‍ර පහ කරන සිය අවශ්‍යතාවය සිදු කරන විට, කිබ්ලාව හෙවත් සලාතය ඉටු කරන දිශාව කරා මුහුණ ලා සිටීම හෝ එයට පිටු පා සිටීම හෝ නොකළ යුතු යි. බැමි හෝ බිත්තිවලින් වසා නොමැති ගොඩනැගිලි නොවන විවෘත ස්ථානවල මල මුත්‍ර පහ කිරීමේ දී මෙකරුණ ගැන සැලකිලිමත් විය යුතු යි.

- ගොඩනැගිල්ලක් තුළ හෝ විවෘත ස්ථානයක හෝ සිය අවශ්‍යතා ඉටු කරනා විට තමන්ගේ රහසඟ අනෙකාට පෙනෙනා අයුරින් සිටීමෙන් වැළකිය යුතු යි.

- මිනිසුන්ගේ මං මාවත්වල හෝ මිනිසුන් ගිම් නිවීම පිණිස අසුන් ගන්නා ස්ථානවල හෝ මල මුත්‍ර පහ කිරීම නිසා අනෙකාට කරදරයක් හිරිහැරයක් වන ඕනෑ ම ස්ථානයක හෝ මල මුත්‍ර පහ කිරීමෙන් වැළකිය යුතු යි.

- එක් තැන රැඳී ඇති ජලයෙහි මල මුත්‍ර පහ නොකළ යුතු යි.

- සත්ත්ව ගුල් වැනි සතුන්ගේ නවාතැන්වල මල මුත්‍ර පහ නොකළ යුතු යි.
- මුත්‍රා කිරීමේ දී සිය වස්ත්‍රය මත හෝ සිය ශරීරය මත මුත්‍රා නොවැගිරීමට හෝ විසි නොවීමට ප්‍රවේසම් විය යුතු යි.
- අල් ඉස්තින්ජාඃ හෙවත් ජලය භාවිතා කරමින් පිරිසිදු කරනා ක්‍රියාවලියෙහි හෝ අල් ඉස්තිජ්මාර් හෙවත් දිය උරනා ගල්, කඩදාසි වැනි පිරිසිදු දෙයක් භාවිතා කරමින් මල මුත්‍ර පිටවන ස්ථාන පිස දමා පිරිසිදු කිරීමේ ක්‍රියාවලියෙහි දී හෝ වමත උපයෝගී කළ යුතු යි.

ජලය පමණක් භාවිතා කරමින් මෙම පිරිසිදු කිරීමෙහි නිරත විය හැකි ය. එපරිද්දෙන් ම, දිය උරනා ගල්, කඩදාසි වැනි පිරිසිදු දෙයක් පමණක් භාවිතා කරමින් මෙම පිරිසිදු කිරීමෙහි නිරත විය හැකි ය. නැතහොත්, මෙම ක්‍රම දෙක ම එකවර උපයෝගී කරගත හැකි ය. මෙය ඉස්ලාමය විසින් සලසා දුන් පහසුවකි.



ඉස්ලාමය මිනිසාගේ පුද්ගලික පවිත්‍රතාවය කෙරෙහි බෙහෙවින් අවධාරණය කරයි. සිය වැසිකිළි කැසිකිළි අවශ්‍යතා ඉටු කළ පසු පිරිසිදුකාරක ද්‍රව්‍ය යොදා සිය දෑත් සේදීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙන්වා දෙයි.



# වුළුඃ කරන්නේ කෙසේ ද?

**වුළුඃ දෝවණය සිදු කරනාකාරය ගැන ප්‍රායෝගික රූපිත විග්‍රහයක්**

**වුළූඃ දෝවණය සිදු කිරීමට මත්තෙන් මුස්ලිම්වරයෙකු අතිශයින් දැනගත යුතු කාරණා පහත සේ ය:**

- නිය්යත් හෙවත් චේතනාවෙන් තොර ව වුළූඃ දෝවණයක් නොමැත; දෙවිඳාණන් වෙනුවෙන් ම පමණක් කරමි යන අවංකභාවයෙන් තොර ව චේතනාවක් ද නොමැත. එනිසා, චේතනාවේ මූලස්ථානය හදවත මිස දිවෙන් උච්චාරණය කරන වචන නොවේ.

- වුළූඃ දෝවණය කෙරෙනා අවයව පිළිවෙළින් සේදීම අත්‍යවශ්‍ය වේ. එම දෝවණය අතර අඛණ්ඩත්වය පවත්වා ගැනීම ද එලෙස ම අත්‍යවශ්‍ය යි. එබැවින්, යම් අවයවයක් වෙනුවට තවත් අවයවයක් පෙරටු කර සේදීම හෝ එක් අවයවයක් සෝදා, අනෙක් අවයවය සේදීමට බොහෝ සේ ප්‍රමාද කිරීම නොකළ යුතු යි.

**මෙම QR කෝඩ් හෙවත් QR කේතය ස්කෑන් කර වුළූඃ දෝවණයට අදාළ දැනුම්වත් කිරීමේ පරිපූර්ණ තොරතුරු දැක බලාගන්න.**



1 **නියය්යත්ඃ චේතනා කරගැනීම.** (එනම්, වචන උච්චාරණය කිරීමකින් තොර ව, හදවතින් සිතාගැනීම මින් අදහස් කෙරේ.) කිල්ලෙන් නිදහස් වන චේතනාවෙන් තොර ව, වුළුඃ දෝවණය නිවැරදි නොවේ. නැමදුමක් සේ සැලකෙන මෙම ක්‍රියාවලිය සිරුරේ ඇතැම් අවයව සේදීමක් යැයි සිතීම ද වැරදි ය. මෙය උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් පමණක් කරමි යන පවිත්‍ර චේතනාවෙන් සිදු කිරීම අපගේ වගකීම යි.



2 **බිස්මිල්ලාහ් යැයි පැවසීමඃ** වුළුඃ දෝවණය ආරම්භයේ දී ((බිස්මිල්ලාහ්)) යැයි පැවසීම ධාර්මික නියමයකි. පසු ව, මුඛ පවිත්‍ර කරගැනීම උදෙසා හැකි අයුරින් දත් මැදගැනීමේ බුරුසුව වැනි යමක් භාවිතා කිරීම.



3

**දෙඅත් මැණික් කටුව තෙක් සේදීම:** දෑතේ ඇඟිලි තුඩුවල පටන් මැණික් කටු දෙක තෙක් තෙවතාවක් සේදීම.

4

**මුඛ සේදීම (අල් මල්මලහ්), නාස් පුඩුවලට වතුර යෙදීම (අල් ඉස්තින්ෂාක්) හා එම වතුර නාස් පුඩුවලින් ඉවත ලෑම (අල් ඉස්තින්සාර්)**

අ- මුඛ සේදීම: එනම්, මුඛයට වතුර දමා කට හොඳින් කලත්තා එය කෙළ ගැසීම යි.

ආ- නාස් පුඩුවලට වතුර යෙදීම: එනම්, දකුණතින් වතුර ගෙන නාස් පුඩුවලට යෙදීම යි.





ඇ- නාස් පුඩුවලින් වතුර ඉවත ලෑම: එනම්, පූර්වයෙන් නාසය තුළට යෙදූ වතුර වමතින් හූරා ඉවත ලෑම යි.

ඉ- උපවාසයෙහි නිරත නොවන සෑම කෙනෙකු ම, මුඛ සේදීම හා නාස් පුඩුවලට වතුර යෙදීම වැඩි වශයෙන් කිරීම සුන්නාහ් හෙවත දේව දූත සම්ප්‍රදායකි.

ඊ- මුඛ සේදීමට හා නාස් පුඩුවලට වතුර යෙදීමට ක්‍රම දෙකක් ඇත:

- එකට කිරීම: එනම්, එක් අහුරකින් දිය ගෙන, දිය අඩකින් මුඛ සෝදා අනෙක් අඩකින් නාස් පුඩුවලට වතුර යෙදීම යි. මෙය දිය අහුරු තුනක් ගෙන තෙවරක් සිදු කෙරේ.

- වෙන් වෙන් ව කිරීම: එනම්, මුඛ සේදීම සඳහා දිය අහුරක් ද, නාස් පුඩුවලට වතුර යෙදීම සඳහා තවත් අහුරක් ද ලෙස වෙන් වෙන් ව කිරීම යි. මෙපරිදි, තෙවරක් සිදු කෙරේ.



**5** **මුහුණ සේදීම:** සුපුරුදු අයුරින් හිස කෙස් හටගන්නා ස්ථානයේ සිට නළලේ අවසානය දක්වා දිග අතට මුහුණේ සීමාව වේ. දෙකන් අතර ඇති ප්‍රමාණය පළල් අතට මුහුණේ සීමාව යි.







උඩු හා යටි රැවුල, ඇහි බැමි, ඇස් පිහාටු වැනි මුහුණේ ඇති සියලු කෙස් සේදීම අනිවාර්ය වේ.

## 6

**දෙඅත් වැලමිට තෙක් සේදීම:** දකුණත් ඇඟිලි තුඩුවලින් පටන්ගෙන, දෙඅත් ඇඟිලි එකට පටලා එම ඇඟිලි අතර ද සෝදා, වැලමිට තෙක් ජලය යොදා සේදිය යුතු යි. මෙපරිදි වමත ද සේදිය යුතු යි.







**7**

**හිස පිරිමැදීම:** අලුතින් ජලය යොදා සිය දෑත්ල තෙමා ගත යුතු යි. පසු ව, හිස ඉදිරිපස කොටසේ දෑත් තබා හිස පිටුපස දක්වා රැගෙන ගොස්, නැවත පටන්ගත් හිස ඉදිරිපසට ම රැගෙන ආ යුතු යි. හිසකෙස් සහිත හා හිසකෙස් රහිත ස්වභාවය මෙම ක්‍රමය කෙරෙහි වෙනසක් ඇති නොකරයි.







**8**

**දෙකන් පිරිමැදීම**: හිස පිරිමැදීමෙන් පසු දෑතෙහි ඉතිරි වූ එම ජලයෙන් දෙකන් පිරිමැදීම මින් සිදු වේ. සිය දෙඅත දබරැඟිලි කන් විවරවලට දමා කනේ අභ්‍යන්තරය පිරිමදින අතරතුර සිය මහපටැඟිලි ආධාරයෙන් දෙකන් භාහිර කොටස පිරිමැදිය යුතු වේ. මෙයාකාරයෙන් දෙකන් අභ්‍යන්තර ව ද, භාහිර ව ද පිරිමැදෙනු ඇත.

හිස පිරිමැදීමත් සමඟ ම දෙකන් පිරිමැදීම යන දෙක්‍රියාව ම වතාවක් පමණක් සිදු වේ.









9

**දෙපා සේදීම**: දකුණු කකුල් ඇඟිලි තුඩුවලින් පටන්, දෙපා වළලු කර තෙක් සේදිය යුතු යි. කෙණ්ඩ දෙක එකතු කරනා කල, කකුල් දෙපස ඇති මතු පිට පෙනෙන අස්ථීන් දෙක වළලු කර ලෙස සැලකේ. පාද ඇඟිලි අතර ජලය යවා සේදිය යුතු යි. පාදයේ පසුපස කොටස වන විළුඹ ද පාදය උඩ කොටස ද යන සියල්ල ආවරණය වන පරිදි හොඳින් සේදීම අනිවාර්ය වේ. අනතුරු ව, දකුණු පාදය සේදූ විලසින් ම වම් පාදය ද සේදිය යුතු යි.







10 **දෙවිඳාණන් ව සිහිපත් කිරීම හා ප්‍රාර්ථනා කිරීම:** වුළූ දෝවණය අවසන් වූ විගස මෙසේ පැවසිය යුතු යි:

**අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීක ලහූ, වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහූ වරසූලුහූ.**

අදහස: අල්ලාහ් හැර සත්‍ය වශයෙන් නැමදුම් ලැබීමට සුදුසු වෙනත් දෙවියෙකු නැති බවටත්; උතුමාණන් ඒකීයවන්තයාණන් බවටත්; උතුමාණන්ට සම කළ හැකි කිසිවක් නැති බවටත් මම සාක්ෂි දරමි. එසේ ම, මුහම්මද්තුමා අල්ලාහ්ගේ ගැත්තා බවටත් අල්ලාහ්ගේ දූතයා බවටත් මම සාක්ෂි දරමි.

අමතර ව මෙලෙස ද පැවසිය හැකි යි:

**අල්ලාහුම්මජ්අල්නී මිනත් තව්වාබීන, වජ්අල්නී මිනල් මුතතහ්හිරීන.**

අදහස: දෙවිඳාණනි, මා පාපක්ෂමාව ලද්දන්ගෙන් කෙනෙකු ලෙස ද පවිත්‍රවන්තයින්ගෙන් කෙනෙකු ලෙස ද පත් කරනු මැනවි!

නැතහොත්, මෙසේ ද පැවසිය හැකි ය:

**සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලා අන්ත, අස්තග්ෆිරුක වඅතූබු ඉලයික.**

අදහස: දෙවිඳාණනි, ඔබ ව ප්‍රශංසාවට ලක් කිරීම මඟින් ඔබ ව සුවිශුද්ධ කරමි, ඔබ හැර සත්‍ය වශයෙන් නැමදුම් ලැබීමට සුදුසු වෙනත් දෙවියෙකු නැති බව මම සාක්ෂි දරමි, ඔබගෙන් සමාව අයදිමි, ඔබ වෙත නැවත හැරී එමි.

**සැලකිය යුතු යි:**

1. හිස සමඟ දෙකන් පිරිමැදිය යුත්තේ වතාවක් පමණි. අනෙකුත් සේදීම් කටයුතු තෙවතාවක් කළ හැකි යි. එසේ තෙවතාවක් කිරීම පරිපූර්ණ වුළූ දෝවණයකි. නැතහොත්, දෙවතාවක් වුව ද කළ හැකි ය. නොමැති නම්, වතාවක් හෝ සේදීම අනිවාර්ය වේ.

2. අවයව ඉහත කී පිළිවෙළින් සේදීම අත්‍යවශ්‍ය යි. එක් අවයවයක් වෙනුවට තවත් අවයවයක් අපිළිවෙළින් පෙරටු කොට සේදීම නොකළ යුතු යි.

3. අවයව සේදීමේ දී අඛණ්ඩතාවය පවත්වා ගැනීම ද අත්‍යවශ්‍ය ය. එක් අවයවයකින් පසු ඊළඟ අවයවය සේදීම සඳහා ප්‍රමාද නොවිය යුතු යි.

## මහා කිල්ලෙන් පවිත්‍ර වීම උදෙසා ස්නානය කරන්නේ කෙසේ ද?

ජනාබත් හෙවත් මහ කිල්ලෙන් මිදීම සඳහා කරන ස්නානය ආකාර දෙකකින් පවතී. අනිවාර්ය සහ පරිපූර්ණ යන ඒ දෙයාකාරය යි. අනිවාර්ය ස්නානය යනු:

1. මහා කිල්ලෙන් නිදහස් වෙමි යන චේතනාව හදවතේ තබා ගැනීම.
2. මුඛ සේදීම, නාස් පුඩුවලට ජලය යෙදීම ඇතුළු ව සම්පූර්ණ ශරීරය ම දියෙන් සේදීම.

**පරිපූර්ණ ස්නානය යනු: අනිවාර්යාංග හා අතිරේක ප්‍රශංසනීය දෑ එකතුවෙන් කරන ස්නානය වේ. එබව පහත පරිදි විස්තර කෙරේ:**

1. මැණික් කටුව තෙක් දෑත් සෑදීම.
2. රහසඟ මත ජලය වත්කර වමතින් එම පෙදෙස් හොඳින් සේදීම.
3. පූර්ණ ලෙස වුළූඃ දෝවණ ක්‍රියාව ඉටු කිරීම, එයට අදාළ අවසාන අංගය වන දෙපා සේදීම ස්නානය අවසානය දක්වා කල් දැමිය හැකි ය.
4. හිස හොඳින් තෙවරක් සේදීම.
5. සිය කෙස් ගොතා සිටින කතක් ජනාබත් (මහා කිල්ල) හෝ මාස් ශුද්ධිය හෝ පසු ප්‍රසව රුධිර වහනය වීම වැනි තත්ත්වයකින් මිදී පිරිසිදු වීම උදෙසා ස්නානය කරනා විට, සියලු හිසකෙස් තෙමෙනා පරිදි ස්නානය කරන්නී නම්, ඇය ගෙතූ එම කෙස් ලිහා දැමීමට අනිවාර්ය නැත.
6. සිරුරේ සමස්ත දකුණු පස සේදීම.
7. සිරුරේ සමස්ත වම් පස සේදීම.

## පිරිසිදු වීමේ ඇතැම් විශේෂිත ක්‍රම හා අවස්ථා

**අත් තයම්මුම්**

ඉස්ලාමයෙහි ලිහිල්කරණයේ එක් අංගයකි මෙම තයම්මුම් අවකාශය. පහසුවෙන් වුළූ දෝවණය කිරීමට හෝ අනිවාර්ය ස්නානය කිරීම සඳහා මුස්ලිම්වරයෙකු ජලය ලබා නොගන්නා අවස්ථාවක ජලයට විකල්පයක් වශයෙන් මෙය පත් කර ඇත. දුර බැහැර ගමනක යෙදී සිටින විටක බීමට පමණක් ප්‍රමාණවත් ජලය ඇති මොහොතක, අමතර ජලයක් මිල දී ගැනීමට නොහැකි විටක හෝ ඉතා අධික වටිනාකමකින් ජලය විකුණන විටක හෝ ජලය ඇතත් රෝගී තත්ත්වයක් සහ වුළූ කිරීම සඳහා අවශ්‍ය ජලය ලබා දීමට උපකාරයක් නොමැති වීම වැනි අවස්ථාවක ජලය භාවිත කළ නොහැකි විට හෝ අධික සීතල හේතුවෙන් ජලය භාවිතා කිරීම නිසා යම් හානියක් සිදු වේවි හෝ වෙනත් සාධාරණ හේතුවක් වැනි දෑ මෙම තත්ත්වයට උදාහරණ ලෙස දැක්විය හැකි ය. මෙවන් තත්ත්වයක දී තයම්මුම් අවකාශය වලංගු වේ. පිරිසිදු පස් මෙම පිරිසිදු කිරීම සඳහා භාවිතා කෙරෙනු ඇත.

**තයම්මුම් කරන්නේ කෙසේ ද?**

තයම්මුම් කරනා බව සිතින් චේතනා කරගත යුතු යි. පසු ව, දෙඅත්ල මඟින් පස් මත වරක් ගසා, අනතුරු ව, එමඟින් සම්පූර්ණ මුහුණ සහ මැණික් කටුව තෙක් දෑත් ද පිරිමැද ගත යුතු යි.

සුළු කිල්ල සහ මහා කිල්ල යන දෙකට ම අදාළ තයම්මුම් ක්‍රමය සමාන ය. පිරිසිදුභාවය කොන්දේසියක් වන සෑම නැමදුම් කටයුත්තක් ම තයම්මුම් කිරීමෙන් අනතුරු ව කිරීමට අවසර ය. ජලය ලැබූ විට හෝ ජලය පරිහරණය කිරීමට හැකියාව ලද විට හෝ තයම්මුම් අවලංගු වේ. එකල, ජලය පරිහරණය කරමින් පිරිසිදු වීම අනිවාර්ය වේ.






## පාවහන් හා මේස් මත පිරිමැදීමඃ

මුස්ලිම්වරයෙකු පාවහන් හෝ මේස් පැලඳ සිටී නම්, වුළුඃ කරනා විට ඒවා ගලවා ඉවත් කිරීම ඔහුට අනිවාර්ය නැත. ඇරත්, දෙපා සෝදන අවස්ථාව පැමිණි විට, දෙපාවහන් මත හෝ මේස් දෙක මත තෙත් අතින් පිරිමැදීම ප්‍රමාණවත් වේ. එනමුත්, මෙම පාවහන් හෝ මේස් පැලඳීමට පෙර ඔහු වුළුඃ කොට සිය දෙපා සෝදා තිබීම කොන්දේසියකි. එසේ නොකර සිටියේ නම්, පාවහන් හෝ මේස් ගලවා ඉවත් කළ යුතු යි.

ග්‍රාමවාසී පදිංචිකරුවෙකුට දවසක් මෙපරිදි සිය පාවහන් හෝ මේස් මත පිරිමැදිය හැකි ය. ගමනක යෙදී සිටින මඟියෙකුට නම්, දවස් තුනක අවකාශයක් ලැබේ.



**ග්‍රාමවාසී පදිංචිකරුවාඃ**

දවසක් සිය පාවහන් හෝ මේස් මත පිරිමැදිය හැකි ය.



**ගමනක යෙදී සිටින මඟියාඃ**

දවස් තුනක් සිය පාවහන් හෝ මේස් මත පිරිමැදිය හැකි ය.



## වෙළුම් පටි මත පිරිමැදීම:

වෙළුම් පටි යනු යම් කිසි අවයවයක් බිඳීමකට හෝ තුවාලයකට ලක් වූ විට එය වෙළා ඇති පටිය යි. මෙම වෙළුම් පටිය වුළූ දෝවණය කෙරෙන අවයවයක ඇත් නම්, වුළූ කරනා විට එම වෙළුම මත තෙත් අතින් පිරිමැදිය යුතු යි. මෙම අවසරය වෙළුම ඉවත් කරගන්නා තුරු ඇත. පිරිසිදු කිරීමකින් පසු මෙම වෙළුම් බැඳීම කොන්දේසියක් නොවේ.

වුළූ කෙරෙන අවයවයෙන් කොටසක් වෙළා නොමැති විටක සහ එම කොටස සේදීමෙන් කිසිදු හානියක් නොමැති අවස්ථාවක එය සෝදා, වෙළුම් දමා ඇති පෙදෙස පෙර කී සේ පිරිමැදිය යුතු යි.

# නිමාව:

වුළූඃ, තයම්මුම් හා ස්නානය යනාදිය සම්බන්ධයෙන් වන අණපනත්වලට අදාළ වැකිය අවසානයේ උත්තරීතර අල්ලාහ් මෙපරිදි ප්‍රකාශ කරන සේක: අල්ලාහ් ඔබලා ව දුෂ්කරත්වයට පත් කිරීමට අපේක්ෂා නොකරන්නේය. එහෙත්, ඔබලා ව පවිත්‍ර කිරීමටත් ඔබලා වෙත ඔහුගේ ආශිර්වාද සම්පූර්ණ කිරීමටත් අපේක්ෂා කරන්නේය. (ඒ හේතුවෙන්) ඔබලාට ගුණගරුක වන්නට හැකි ය. (පරිච්ඡේදය අල්මාඉදා : වැකිය 06)

මෙහි අදහස: සලාතය සඳහා වන වුළූඃ දෝවණය, ජනාබත් සඳහා වන ස්නානය, සාධාරණ හේතූන් මත කෙරෙන තයම්මුම් වැනි අනිවාර්ය දේවල් මඟින් උත්තරීතර අල්ලාහ් ඔබ ව අපහසුතාවයට ලක් කරන කිසිදු කටුක, දුෂ්කරතාවයකට පත් කිරීමට අපේක්ෂා නොකරන්නේය. එහෙත්, ආධ්‍යාත්මය හා බැඳි පාපය දුෂ්ට හැඟීම් සහ අනෙකුත් භෞතික අපද්‍රව්‍යවලින් ඔබේ ආත්මය පවිත්‍ර කිරීමට ය ඔහු අපේක්ෂා කරනුයේ. එසේ ම, පහසු නීති රීති, උසස් ගතිගුණ හා මහිමාන්විත පැවරීම් හරහා ඔහුගේ ආශිර්වාදය විශ්වාසවන්තයින් වන ඔබලා වෙත පරිපූර්ණ කිරීමට ද, ඔහුගේ එම ආසිරි, උපකාර, නීති රීති සංග්‍රහ වෙනුවෙන් ඔබලා ඔහුට කෘතඥපූර්වක වීම ද ඔහු අපේක්ෂා කරයි. මන්ද, ඔබ ඔහුට ස්තුති කරනා සෑම කල, ඔහුගේ ආශිර්වාද හා දායාද ඔබ වෙනුවෙන් ඔහු වැඩි කර දෙන්නේය.

සර්වඥ වන්නේ අල්ලාහ් ම ය, උතුමාණන්ගේ ගැත්තා හා දූතයා වන මුහම්මද්තුමා කෙරෙහි උතුමාණන්ගේ ආශිර්වාදය හා අභිවෘද්ධිය අත් වේවා!





# ඇගයීම

**1** නිවැරදි නම් නිවැරදි ලෙස හෝ වැරදි නම් වැරදි ලෙස දක්වන්න.

☐ ඉස්ලාමය තුළ පිරිසිදුභාවය වස්ත්‍රයට, ශරීරයට හා ස්ථානයට පමණක් සීමා වේ.

☐ වුළූඃ දෝවණය මගින් ගැත්තෙකු සිය දෑසින් හෝ දෑතින් හෝ පාදවලින් හෝ කළ පාපයන් පවිත්‍ර කෙරෙනු ඇත.

☐ මාස් ශුද්ධිය ඇති කාන්තාවකට උපවාස වගකීම බිඳ වැටෙන අතර සලාතය කෙරෙහි වගකීම බිඳ නොවැටේ.

☐ කට තුළ වතුර දමා, කලත්තා, කෙළ ගැසීම ඉස්තින්ෂාක් ලෙස නම් වේ.

☐ එක් ජල අහුරකින් මුඛය සේදීම හා නාස් පුඩුවලට වතුර යෙදීම කළ නොහැකි ය.

☐ මුහුණ සේදීමේ දී නළල සේදීම අත්‍යවශ්‍ය නොවේ.

☐ වුළූඃ දෝවණයෙහි දී බහුල ව පවතින වරදක් නම්, සිය විළුඹ නිසි ලෙස සේදීමට අමතක කිරීම යි.

☐ අනිවාර්ය ජනාබත් ස්නානයෙහි ක්‍රමය වන්නේ සිය ශරීරය මුළුමනින් ම සේදීමත් සමග ම, මුඛය සේදීම හා නාස් පුඩුවලට වතුර යෙදීම යි.

☐ සුළු කිල්ල සඳහා ගන්නා තයම්මුම්හි විලාසය හා මහ කිල්ල සඳහා ගන්නා තයම්මුම්හි විලාසය අතර වෙනසක් ඇත.

☐ පාවහන් මත පිරිමැදීමේ කොන්දේසියක් වන්නේ එය පැලඳීමට පෙර පිරිසිදු ව (වුළු දෝවණය කොට) පැලඳ තිබීම යි.

☐ වෙළුම් පටි මත එහි අත්‍යවශ්‍යතාවය නැති වන තුරු පිරිමැදිය හැකි ය.

**2** සලාතය පිළිගනු ලැබීම සඳහා වුළූඃ අනිවාර්ය වන බව තහවුරු කරන සාධකයක් දක්වන්න.

.......................................................................................................

.......................................................................................................

**3** මුස්ලිම්වරයෙක් අමතක වීමකින් වුළූඃ නොමැති ව සලාතය කළේ නම්, ඔහුගේ සලාතය·

☐ වලංගු ය ☐ අවලංගු ය

**4** නිවැරැදි පිළිතුර තෝරන්න·

1. පිරිසිදුකම අනිවාර්ය වන අවස්ථා:

☐ උපවාසය ☐ සලාතය ☐ උත්තරීතර අල්ලාහ් ව සිහිපත් කිරීම

2. මල මුත්‍ර පිටවන ස්ථාන දිය උරනා ගලකින් හෝ කඩදාසිවලින් පිස දැමීම හැඳින්වෙන්නේ:

☐ අල් ඉස්තින්ජාඃ ☐ අල් ඉස්තිජ්මාර් ☐ අල් ඉස්තින්සාර්

# ඇගයීම

**5** වුළූඃහි මහිමයන් තුනක් දක්වන්න.

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

**6** පහත සඳහන් හිස්තැන් පුරවන්න.

1. සලාතය කරන්නා සිය සලාතයට මත්තෙන් ....................................................... සහ ............................................................... වලින් පිරිසිදු විය යුතු යි.

2. මල මුත්‍ර පහ කිරීමේ ඇතැම් ආචාර විධි වන්නේ ........................................ ................ සහ .................................................................................................... .................

3. ........................................................ යන ප්‍රකාශයෙන් වුළූඃ දෝවණය ආරම්භ කරන අතර පසු ව, මුඛ පවිත්‍ර කරගැනීම උදෙසා හැකි අයුරින් ........................... ........................................................ භාවිතා කිරීම.

4. ග්‍රාමවාසී පදිංචිකරුවෙකුට පාවහන් මත පිරිමැදීම සඳහා ලැබෙන අවකාශ කාලය ..................................... වන අතර මඟියෙකුට .....................................වේ.

**7** ඉස්ලාමය ආධ්‍යාත්මික හා භෞතික පවිත්‍රත්වයට මඟ පෙන්වයි. එබව තහවුරු කරන උදාහරණ ඉහත කරුණු දෙක සඳහා ම දක්වන්න.

....................................................................................................................................

....................................................................................................................................

8 නජස් යනු කුමක් ද?

........................................................................................................................................

........................................................................................................................................

9 ඉස්තින්ෂාක් සහ ඉස්තින්සාර් අතර වෙනස කුමක් ද?

........................................................................................................................................

........................................................................................................................................

10 වුළූඃ දෝවණයෙන් පසු පැවසිය යුතු ප්‍රාර්ථනාව ඔබ මතනය කළෙහි ද? එය ලියා දක්වන්න.

........................................................................................................................................

........................................................................................................................................

11 ප්‍රශංසනීය පරිපූර්ණ ස්නානය කරනාකාරය ලියා දක්වන්න.

........................................................................................................................................

........................................................................................................................................

12 සලාතයට වේලාව පැමිණි නමුත්, කෙනෙකුට ජලය ලැබුණේ නැත. එකල, ඔහු කළ යුත්තේ කුමක් ද?

........................................................................................................................................

........................................................................................................................................

# වුළූඃ දෝවණය ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙතකි

වුළූඃ දෝවණය ඉස්ලාමයේ සංකේතාත්මක අංග අතුරින් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙතක් බව ද පාපය හා වැරදිවලින් පවිත්‍රත්වය ලබා දෙන මාර්ගයක් බව ද එහි විශේෂිත ලක්ෂණ හේතුවෙන් ප්‍රභාමත් හා දීප්තිමත් පුද්ගලයින් ලෙස මුස්ලිම්වරුන් විනිශ්චය දින එක් රැස් කරනු ලබන බව ද මුස්ලිම්වරයෙකු නොදැන සිටිය නොහැක. හැකියාව ඇති විශ්වාසවන්තයෙකුගේ සලාතය වුළූඃ දෝවණයෙන් තොර ව නිවැරැදි නොවේ. එනිසා, විශ්වාසවන්තයෙකු මෙබව දැන ඉගෙනගැනීමට හා ඉගැන්වීමට උත්සුක විය යුතු යි. එය ඉමහත් කර්තව්‍යයකි.

මෙම පොත් පිංච ආශ්‍රයෙන් පිරිසිදුකම, වුළූඃ දෝවණය හා එහි ක්‍රමය ඉදිරිපත් කිරීම ය අපගේ උනන්දුව වූයේ. එපරිද්දෙන් ම, පහත QR කේතය ස්කෑන් කිරීම හරහා වුළූඃ දෝවණය කරනාකාරය පිළිබඳ දෘශ්‍ය පට තොරතුරු නැරඹිය හැකි යි.




يجوز
1:32 / 7:17

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

CHAT & DECIDE

ඉස්ලාමය ගැන නොයෙකුත්
භාෂාවලින් සාකච්ඡා කරන්න

GUIDE TO ISLAM

ඉස්ලාම් දහම පිළිබඳ වැඩි
විස්තර සඳහා

වුළූඃ දෝවණය ඉස්ලාමයේ සංකේතාත්මක අංග අතුරින් ශ්‍රේෂ්ඨ සංකේතාත්මක පිළිවෙතක් බව ද පාපය හා වැරදිවලින් පවිත්‍රත්වය ලබා දෙන මාර්ගයක් බව ද එහි විශේෂිත ලක්ෂණ හේතුවෙන් ප්‍රභාමත් හා දීප්තිමත් පුද්ගලයින් ලෙස මුස්ලිම්වරුන් විනිශ්චය දින එක් රැස් කරනු ලබන බව ද මුස්ලිම්වරයෙකු නොදැන සිටිය නොහැක. හැකියාව ඇති විශ්වාසවන්තයෙකුගේ සලාතය වුළූඃ දෝවණයෙන් තොර ව නිවැරැදි නොවේ. එනිසා, විශ්වාසවන්තයෙකු මෙබව දැන ඉගෙනගැනීමට හා ඉගැන්වීමට උත්සුක විය යුතු යි. එය ඉමහත් කර්තව්‍යයකි.

මෙම පොත් පිංච ආශ්‍රයෙන් පිරිසිදුකම, වුළූඃ දෝවණය හා එහි ක්‍රමය ඉදිරිපත් කිරීම ය අපගේ උනන්දුව වූයේ. එපරිද්දෙන් ම, පහත QR කේතය ස්කෑන් කිරීම හරහා වුළූඃ දෝවණය කරනාකාරය පිළිබඳ දෘශ්‍ය පට තොරතුරු නැරඹිය හැකි යි.

osoulcenter

www.osoulcontent.org.sa

ISO 9001

International Organization for Standardization

භාෂා කිහිපයකින් මෙම පොත සහ වෙනත් පොත් බාගත කිරීම සඳහා

OSOUL STORE

osoulstore.com